## සංක්ෂේපයෙන්

නව යෞවන අවධිය පුද්ගලයකුගේ ජීවිතයේ කායික, මානසික, සමාජමය හා සදාචාරමය යන වර්ධනය ක්ෂේත්‍රයන්හි ඉතා වේගවත් වර්ධනයක් පෙන්නුම් කරන ශක්තිමත් වැඩිහිටි ජීවිතයකට අත්තිවාරම දමන ඉතාමත් වැදගත් අවධියකි. මෙම අවධියේදී නව යෞවන දරුවන් තුළ ඇති විවිධාකාරවූ සමාජයීය අවශ්‍යතා රැසක් පැන නගී. නවයෞවන දරුවන් තුළ ඇති වන්නා වූ මෙම සමාජයීය අවශ්‍යතා මෙම අධ්‍යපනයේ මූලික තේමාව වෙයි.

ප්‍රධාන අරමුණු හතරක් ඔස්සේ මෙම පර්යේෂණ අධ්‍යයනය සිදු කරන ලදී. එනම් නව යොවුන්වියේ පාසැල් සිසුන්ගේ සමාජයීය අවශ්‍යතා හඳුනා ගැනිම, විවිධ ආර්ථික මට්ටම්වල දෙමාපියන් එම සමාජයීය අවශ්‍යතා පිළිබඳව දක්වන ප්‍රතිචාර විමර්ශන කිරීම, දෙමාපියන්ගේ එම ප්‍රතිචාර වල හිතකර හා අහිතකර ප්‍රතිඵල සොයා බැලීම සහ නව යෞවන්වියේ පාසැල් සිසුන්ගේ සමාජයීය අවශ්‍යතා සම්බන්ධයෙන් දෙමාපිය ප්‍රතිචාර යහපත් කිරීම සම්බන්ධව යෝජනා ඉදිරිපත් කිරීම යනුවෙනි.

අධ්‍යයනය සඳහා පානදුර අධ්‍යාපන කොට්ඨාසයට අයත් 1C වර්ගයේ පාසැල් තුනක්ද 1AB වර්ගයේ පාසැල් දෙකක් ද ඇතුළත් වන පරිදි විවිධ ආර්ථික මට්ටම් වලට අයත් නව යෞවනියන් 25 දෙනෙකු සහ නව යෞවනයන් 25 දෙනෙකු වශයෙන් 50 දෙනෙකුගේ නියැදියක් යොදා ගන්නා ලදී. ඒ අතර විවිධ ආර්ථික මට්ටම් වලට අයත් දෙමව්පියන් 20 දෙනෙකුද ඇතුලත් වූ අතර ප්‍රශ්නාවලියක් සහ සම්මුඛ සාකච්ජා ඇසුරෙන් අධ්‍යයනය සඳහා දත්ත එක් රැස් කර ගන්නා ලදී.

සරල ක්‍රම ශිල්පයන් වන ප්‍රතිචාර සංඛ්‍යාතයන් ප්‍රතිශත බවට පත්කිරීම සහ ගුණාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිත කරමින් වර්තමාන අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය සිදු කරන ලද අතර, එයින් ලැබුනු අනාවරණයන් අනුව නිගමන වලට එළඹීම සිදුකරන ලදී. එසේම නියැදියට අයත් වූ නව යෞවන පාසැල් සිසුන් තුළ පැන නගින්නාවූ සමාජයීය අවශ්‍යතා වන ප්‍රබලතා. අනුපිළිවෙලක් හඳුනා ගන්නා ලදී. ලබා ගන්නා ලද දත්තයන් අනුව මෙම නව යෞවන දරුවන් තුළ ආධාර ලැබීම, අන්‍යයන් ආරක්ෂා කිරීම, අනුබද්ධතාව, නායකත්ව අවශ්‍යතාවය සහ දක්ෂතා ප්‍රදර්ශනය යන සමාජයීය අවශ්‍යතාවයන් ප්‍රබලවම ඇතිවන බව හඳුනාගන්නා ලද අතර "ආක්‍රමණ අවශ්‍යතාවය" ඔවුනට අඩුවෙන්ම දැනෙන

අවශ්‍යතාවය ලෙස හඳුනා ගන්නා ලදි. එසේම මෙම අවශ්‍යතාවයන් පිළිබඳව විවිධ ආර්ථික මට්ටම්වල දෙමාපියන්ගේ ප්‍රතිචාර විමර්ශනය කිරීමේදී සෑම ආර්ථික මට්ටමකම දෙමාපියන් වඩා හොඳ සහයෝගයකින් දරුවන් කෙරෙහි ක්‍රියාකර ඇති බව පැහැදිලි වූ අතර විශේෂයෙන් ඉහළ ආර්ථික මට්ටමක් සහිත දෙමාපියන්ගේ ප්‍රතිචාර වඩාත්ම යහපත් බව පෙනී ගියේය. අවසානයේ ලැබුනු සිසු ප්‍රතිචාර සහ දෙමාපිය ප්‍රතිචාරත් පරීක්ෂකයාගේ අත්දැකීම්ද අනුව නව යොවුන් වියේ පාසැල් සිසුන්ගේ සමාජයීය අවශ්‍යතා සම්බන්ධයෙන් දෙමාපිය ප්‍රතිචාර වඩාත් යහපත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදි.